# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2103/34 - 2018 දෙසැම්බර් මස 28 වැනි සිකුරාදා - 2018.12.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මා විසින් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් නොවන අමාත්‍යවරුන්ට පැවරිය යුතු විෂයයන් හා කාර්යයන් සහ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන නිශ්චය කර ඇති හෙයින්

එකී අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් නොවන අමාත්‍යවරුන් භාරයේ පැවතිය යුතු විෂයයන් හා කාර්යයන්, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන මෙම නිවේදනයේ දිනයේ සිට මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් පරිදි විය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2018 දෙසැම්බර් මස 24 වන දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.


1A - G 28932 — 400 (12/2018)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

**(1) ඩිජිටල් යටිතල පහසුකම් සහ තොරතුරු තාක්ෂණ අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1 ඩිජිටල් යටිතල පහසුකම් සහ තොරතුරු තාක්ෂණ විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයය අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය හා ඊට අනුබද්ධිත ආයතන | • තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත (2003 අංක 27) |
| 2 නවීන තාක්ෂණය යොදා ගනිමින් සැමටඩිජිටල් යටිතල පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. | 2. ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය | • ඉලෙක්ට්‍රොනික් ගනුදෙනු පනත (2006 අංක 19) |
| 3 අන්තර් රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය තුළින් රජයේ සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හිත් අනෙකුත් රාජ්‍ය ව්‍යවසායන්හිත් සේවා සැපයීමේ ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය ඉහල නැංවීම සඳහා ඩිජිටල් පරිණාමන මූලාරම්භන සඳහා පහසුකම් සැපයීම හා අධීක්ෂණය. | 3. සියලුම තොරතුරු තාක්ෂණඋද්‍යාන | • වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II වැනි තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |
| 4 ඩිජිටල් සාක්ෂරතාවය ප්‍රවර්ධනය සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම. | | |
| 5 සමාජයේ සියළුම ස්ථරවල තොරතුරු තාක්ෂණය භාවිතය ධෛර්යමත් කිරීම හා ඉහළ නැංවීම සඳහා උපාය මාර්ග සංවර්ධනය සහ පුද්ගලික අංශය සමඟ හවුල් වී ඩිජිටල් ආර්ථික මූලාරම්භයන් සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීම. | | |
| 6 තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා පහසුකම් සැලසීම. | | |
| 7 සයිබර් ආරක්ෂණයට අදාළ සිද්ධීන් සම්බන්ධයෙන් සක්‍රීයව මැදිහත්වීම හා එවැනි සිද්ධීන් වැලැක්වීම පිණිස වූ ජාතික මධ්‍යස්ථානය පිළිබඳ කටයුතු හා | | |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(1) ඩිජිටල් යටිතල පහසුකම් සහ තොරතුරු තාක්ෂණ අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| එමගින් අදාළ නීති ක්‍රියාත්මක කිරීමේ ආයතනවලට ඩිජිටල් වෝහාරික පරීක්ෂණ සඳහා අවශ්‍ය කරනු ලබන තාක්ෂණික සහාය ලබාදීම. | | |
| 8 ඩිජිටල් යටිතල පහසුකම්වල ආරක්ෂාව පිළිබඳ විගණන හා සයිබර් ආරක්ෂණ සේවා කළමනාකරණ කටයුතු. | | |
| 9 ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ සංවර්ධනයේ දී, ජාත්‍යන්තර සහයෝගීතාවය, සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීම | | |
| 10 II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 11 II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**(2) විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තුවට හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br><br>2. අන්තර්ජාතික වශයෙන් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රවල සිදුවන පර්යේෂණයන්හි නව සොයා ගැනීම්වලට අනුගතවන | 1 ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ්<br><br>2 ජාතික මූලික අධ්‍යයන ආයතනය<br><br>3 ජාතික විද්‍යා පදනම<br><br>4 ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව<br><br>5 ග්‍රහලෝකාගාරය<br><br>6 නවීන තාක්ෂණවේදය සඳහා වන ආතර් සී ක්ලාක් ආයතනය | • විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත (1994 අංක 11)<br><br>• අනුකූලතා ඇගයීම සඳහා වන ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනත (2005 අංක 32)<br><br>• ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත (1984 අංක 6)<br><br>• ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීම් පනත (1979 අංක 53) |

**උපලේඛනය** *(සම්බන්ධිතයි)*

**(2) විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන අමාත්‍ය** *(සම්බන්ධිතයි)*

*I වැනි තීරුව*
*කාර්යයන් හා කර්තව්‍යයන්*

පරිදි දේශීය පර්යේෂණ හා සොයාගැනීම් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම

3. දැනුම පාදක කරගත් ආර්ථික සංවර්ධනයක් උදෙසා විද්‍යාව, තාක්ෂණය හා නවෝත්පාදනයන් වැඩිදියුණු කිරීම
4. විද්‍යාත්මක, කාර්මික හා සමාජ, ආර්ථික පර්යේෂණ හා සංවර්ධන කටයුතු පුළුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
5. පර්යේෂණ හා පර්යේෂණ ආයතනවලට පහසුකම් සැපයීම තුළින් පර්යේෂණ සැලසුම් කිරීම හා මෙහෙයවීම
6. තොරතුරු, නැනෝ, රොබෝ, යාන්ත්‍ර-ඉලෙක්ට්‍රොනික හා ජෛව තාක්ෂණයද ඇතුලුව නව පර්යේෂණ හා සොයා ගැනිම් වලින් ලබාගන්නා ප්‍රතිඵල හා දැනුම ව්‍යාපාරික ප්‍රජාවද ඇතුලුව අදාළ පාර්ශවයන් වෙත ලබාදීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
7. ප්‍රමිතීන් පැනවීම සහ පරිපාලනය සම්බන්ධ කටයුතු
8. වෙනත් අමාත්‍යාංශ විෂය පථයට යටතේ ගැනෙන පර්යේෂණ ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන පර්යේෂණ සඳහා තාක්ෂණික සහාය ලබාදීම
9. නව සොයාගැනිම් සඳහා ප්‍රජාව යොමු කිරීම සහ පෙළඹවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
10. විද්‍යාව, තාක්ෂණය හා නවෝත්පාදනයන් ප්‍රජාව වෙත හඳුන්වාදීම හා ඒ ආශ්‍රිත ව්‍යවසායකයන් බිහි කිරීම

*II වැනි තීරුව*
*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

7 අනුකූලතා තක්සේරු පිලිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය
8 ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
9 ශ්‍රී ලංකා නිමැයුම්කරුවන්ගේ කොමිසම
10 නිමැයුම්කරුවන්ගේ අරමුදල
11 ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
12 ජාතික පර්යේෂණ සභාව
13 ශ්‍රී ලංකා බුද්ධිමය දේපල කාර්යාලය
14 කාර්මික තාක්ෂණ ආයතනය
15 විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ලේකම් කාර්යාංශය
16 නීල හරිත වර්ධන කාර්යාංශය
17 දැව ආශ්‍රිත නිර්මාණ මධ්‍යස්ථානය
18 රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ඨතා මධ්‍යස්ථානය(CERA)
19 විද්‍යාතා මධ්‍යස්ථාන

*III වැනි තීරුව*
*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- ශ්‍රී ලංකාවේ මූලික අධ්‍යයන ආයතන පනත (1981 අංක 55)
- බුද්ධිමය දේපල පනත (2003 අංක 36)
- ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය පනත (1998 අංක 59
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**(2) විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන අමාත්‍ය** (සම්බන්ධිතයි)

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 11. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සියළුම පර්යේෂණ ආයතන සම්බන්ධීකරණය කරමින් ජාතික සංවර්ධන අරමුණු සාධනය සඳහා සක්‍රීය දායකත්වය ලබාදීම | | |
| 12. ජාත්‍යන්තර විද්‍යා, තාක්ෂණික හා පර්යේෂණ ආයතන සමග සම්බන්ධීකරණය කිරීම හා සහයෝගිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |
| 13. විවිධ රටවල් සමඟ ද්වීපාර්ශවීය හා බහුපාර්ශවීය සහයෝගිතාවයන් ඇතිකර ගනිමින්, විද්‍යාව තාක්ෂණය හා පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් ආර්ථික ප්‍රගතිය ඇති කිරීම | | |
| 14. ඉදිකිරීම් කර්මාන්තය ප්‍රවර්ධනය, සංවර්ධනය සඳහා වූ පර්යේෂණ ක්‍රියාත්මක කිරීම | | |
| 15. බුද්ධිමය දේපල පිලිබඳ ජාත්‍යන්තර සම්මුතිය පරිපාලනය කිරීමට අදාළ කාර්යයන්හි ප්‍රකාශන අයිතිය හා ජගත් බුද්ධිමය දේපල කාර්යාලයෙහි ප්‍රකාශන අයිතිය සම්බන්ධ කටයුතු | | |
| 16. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 17. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

උපලේඛනය *(සම්බන්ධිතයි)*

**(3) පොදු සැපයීම් සහ ආර්ථක ප්‍රතිසංස්කරණ අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන අමාත්‍ය** (සම්බන්ධිතයි)

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. පොදු සැපයීම් සහ ආර්ථික ප්‍රතිසංස්කරණ විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන ව්‍යවස්ථාපිත ආයතනට විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 1. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය | • ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනත (1988 අංක 53)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |
| 2. ශ්‍රී ලංකාවේ ආර්ථික අභිමතාර්ථ සාධනය උදෙසා සිදුකල යුතු සාර්ව ආර්ථික ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම හා එම ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීමට හැකි උපායමාර්ගික ප්‍රවේශයන් හඳුන්වාදීම | | |
| 3. ශ්‍රී ලංකා මහ බැංකුව සහ සියළුම අමාත්‍යාංශ සම්බන්ධීකරණය කරමින් ජාතික ආර්ථිකයේ සිදුකල යුතු ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණයන් සඳහා ජාතික ආර්ථික සභාවට සහාය වීම | | |
| 4. අදාල සියලු ආයතන සම්බන්ධිකරණය කරමින් දළ දේශීය නිශ්පාදනය හා ඒක පුද්ගල ආදායම වර්ධනය සඳහා කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන උපායමාර්ගික ප්‍රතිසංස්කරණයන් යෝජනා කිරීම | | |
| 5. ආර්ථික ප්‍රතිසංස්කරණ සිදුකිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික හා මූල්‍යාධාර ලබා ගැනීමට ජාත්‍යන්තර ආයතන සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කිරීම | | |
| 6. නීල හරිත ආර්ථික උපාය මාර්ග හඳුන්වා දෙමින් තිරසර ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම සඳහා යෝජනා සැකසීම | | |
| 7. ජීවන වියදම කළමනාකරණය කිරීම සඳහා උපායමාර්ග හඳුන්වාදීම | | |

*උපලේඛනය(සම්බන්ධිතයි)*

**(3) පොදු සැපයීම් සහ ආර්ථක ප්‍රතිසංස්කරණ අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන අමාත්‍ය** (සම්බන්ධිතයි)

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 8. රැකියා වියුක්තිය පිටුදැකීම සඳහා වූ උපායමාර්ගික යෝජනා ක්‍රම හඳුන්වාදීම | | |
| 9. ශ්‍රී ලංකාවේ දිළිඳුභාවය පිටුදැකීම සඳහා වූ සමාජ ආර්ථික ප්‍රතිසංස්කරණයන් හඳුන්වාදීම | | |
| 10. ප්‍රජාවගේ පොදු, අත්‍යාවශ්‍ය සහ හදිසි අවශ්‍යතා හා හදිසි සැපයුම් සේවාවන් කාර්යක්ෂමව ඉටුකිරීම | | |
| 11. ආපදා සහ හදිසි අවස්ථා උද්ගත වූ විට අත්‍යාවශ්‍ය මහජන සැපයුම් සේවාවන් සම්බන්ධීකරණය කිරීම | | |
| 12. පොදු සැපයුම් සේවා ඵලදායි ලෙස පවත්වා ගැනීමට හැකි දියුණු තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දීම | | |
| 13. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 14. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.